// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2046/51 - 2017 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 42/73(II).

**(363 වන අධිකාරය වූ) වෙඩි පිටි සහ හමුදා අභ්‍යාස පනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වැනි ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වැනි වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත (363 වන අධිකාරය වූ) වෙඩි පිටි හා හමුදා අභ්‍යාස පනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, -

(1) ඉඩම් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මෙහි උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති, ''චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයේ සැහැල්ලු අවි වෙඩි පිටිය'' යනුවෙන් හැඳින්විය යුතු වෙඩි පිටියක් පිහිටුවනු ලබන බවත් එම වෙඩි පිටියේ මායිම් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති මායිම් විය යුතු බවත් ;

(2) ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබ 1983 ඔක්තෝබර් මස 28 දිනැති අංක 268/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලද නියමය, එය යටතේ සිදු කරන ලද කිසිවකට අගති විරහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලබන බවත්,

මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| චීන වරාය ගුවන් හමුදා විද්‍යාපීඨයේ මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටිය | නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය (නගරය සහ කඩවත්) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, නාච්චිකුඩා ගමේ පිහිටියා වූ නාච්චිකුඩාකඩු නම් වූ ඉඩමට මිනුම්දෝරු ජනරාල්වරයා විසින් මැන සාදන ලද 2014 සැප්තැම්බර් මස 12 වැනි දින දරන සහ අංක Tri/TWG/2014/158 දරන ප්‍රලේඛනයේ ලොට් ''A'' වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2985 ක් වන පහත දැක්වෙන මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල. |

1A - G 26665 — 08 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | |
|---|---|
| උතුරට | : අ.ග.පි. 21 හි ලොට් අංක 533 ; |
| නැගෙනහිරට | : අ.ග.පි. 21 හි ලොට් අංක 533 ; |
| දකුණට | : අ.ග.පි. 21 හි ලොට් අංක 533 සහ ; |
| බස්නාහිරට | : අ.ග.පි. 21 හි ලොට් අංක 533. |

12 - 197/1

---

එල්.ඩී.බී. 42/73(II)

**(363 වන අධිකාරය වූ) වෙඩි පිටි සහ හමුදා අභ්‍යාස පනත**

3 වන වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වැනි ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වැනි වගන්තිය සමඟ කියවිය යුතු සංශෝධිත (363 වන අධිකාරය වූ) වෙඩි පිටි හා හමුදා අභ්‍යාස පනතේ 3(1) සහ 2(ආ) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මෙම නියමය මගින් -

(අ) මෙහි උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති, වෙඩි පිටිය එම උපලේඛනයේ II තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති සැහැල්ලු අවිවලින් වෙඩි තැබීමේ අභ්‍යාස සඳහා ප්‍රයෝජනයට ගත යුතු බවට නිශ්චය කරමි ;

(ආ) එම උපලේඛනයේ II තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඉහත කී වෙඩි පිටිය සැහැල්ලු අවිවලින් වෙඩි තැබීමේ අභ්‍යාස සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පූර්ව අනුමතය ලබා ගන්නා ලද අනෙකුත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනය විසින් භාවිත කළ හැකි බවට නිශ්චය කරමි ; සහ

(ඇ) ඉහත කී පනතේ 3 වන වගන්තිය යටතේ සාදනු ලැබ 1983 ඔක්තෝබර් මස 28 දිනැති අංක 268/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය, එය යටතේ සිදු කරන ලද කිසිවකට අගති විරහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලබන බවට

ප්‍රකාශ කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨය මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටිය | (අ) විෂ්කම්භය මි.මී 7.62 ක දක්වා වූ ස්වයංක්‍රීය සැහැල්ලු අවි ;<br>(ආ) බෝර 12 දක්වා වූ තුවක්කු ;<br>(ඇ) විෂ්කම්භය මි.මී. 11.43 (අඟල් 0.45) දක්වා වූ පිස්තෝල සහ රිවෝල්වර් ;<br>(ඈ) විෂ්කම්භය මි.මී. 9 දක්වා වූ සැහැල්ලු ස්වයංක්‍රීය අවි. |

12 - 197/2

එල්.ඩී.බී. 42/73(II).

**(363 වන අධිකාරය වූ) වෙඩි පිටි සහ හමුදා අභ්‍යාස පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වැනි ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වැනි වගන්තිය සමඟ කියවිය යුතු (363 වන අධිකාරය වූ) වෙඩි පිටි හා හමුදා අභ්‍යාස පනතේ 17 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක ........... දරන චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයේ මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටි නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ''මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) චීන වරායේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයේ මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටිය.

(අ) මි.මී 7.62 ක දක්වා විෂ්කම්භයකින් යුතු ස්වයංක්‍රීය සැහැල්ලු අවි ;

(ආ) බෝර 12 දක්වා වූ තුවක්කු ;

(ඇ) මි.මී. 11.43 (අඟල් 0.45) දක්වා විෂ්කම්භයකින් යුතු පිස්තෝල සහ රිවෝල්වර් ; සහ

(ඈ) මිලිමීටර් 9 දක්වා වූ සැහැල්ලු ස්වයංක්‍රීය අවි වලින් වෙඩි තැබීම සඳහා හැර වෙනත් වෙඩි තැබීම් සඳහා භාවිත නොකළ යුතු ය.

3. ගුවන් හමුදාපතිවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධරයකු විසින් හෝ මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියේ සියලු මායිම් ඔස්සේ සුදුසු පරතරය ඇතිව දැන්වීම් ප්‍රකට සහ ස්ථිර ලෙස ප්‍රදර්ශනය කිරීමට සලස්වනු ලැබිය යුතු ය. එම ස්ථානයෙන් ඇතුළත සැහැල්ලු අවි වෙඩි පිටියක් පිහිටුවා ඇති බව ද වෙඩි තැබීම ආරම්භ කිරීමට සූදානම් වන විට හෝ වෙඩි තැබීම් පවත්වනු ලබන විට පහත දැක්වෙන ස්ථානවල දිවා කාලයේ දී රතු කොඩි ඔසවා තබනු ලබන බව ද රාත්‍රී කාලයේ දී වටේට රතු ආලෝකයක් දල්වනු ලබන බවට එම දැන්වීම්වල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(අ) වෙඩි කන්ද සහ පිට වෙඩි කන්ද ;

(ආ) වෙඩි තැබීමේ ස්ථානවල ; සහ

(ඇ) මඩකලපුව - ත්‍රිකුණාමල ප්‍රධාන පාරේ චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයට හැරෙන හන්දිය සහ මඩකලපුව - ත්‍රිකුණාමල ප්‍රධාන මාර්ගයේ සිට චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයට දිවෙන මාර්ගයේ උප ආරක්ෂක මැදිරියට ඉදිරියෙන් වූ ස්ථානයක.

4. ගුවන් හමුදාපතිවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධරයකු විසින් මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියේ වෙඩි තැබීම් ආරම්භ කිරීමට පැය භාගයකට පෙර සහ වෙඩි තැබීී අවසන් වන කාලය තෙක් වූ කාලය තුළ පහත දැක්වෙන ස්ථානවල දී දිවා කාලයේ දී රතු කොඩි ඔසවා තැබීමට ද, රාත්‍රී කාලයේ දී වටේටම රතු ආලෝකයක් දල්වා තැබීමට ද කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(අ) වෙඩි කන්ද සහ පිට වෙඩි කන්ද ;

(ආ) වෙඩි තැබීමේ ස්ථානවල ; සහ

(ඇ) මඩකලපුව - ත්‍රිකුණාමල ප්‍රධාන පාරේ චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයට හැරෙන හන්දිය සහ මඩකලපුව - ත්‍රිකුණාමල ප්‍රධාන මාර්ගයේ සිට චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයට දිවෙන මාර්ගයේ උප ආරක්ෂක මැදිරියට ඉදිරියෙන් වූ ස්ථානයක.

5. 3 වන නියෝගයට අනුව මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියේ රතු කොඩි ඔසවා තබනු ලබන හෝ රතු ආලෝක දක්වනු ලබන කාලසීමාව තුළ මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියට, වෙඩි තැබීම්වලට සහභාගි වන තැනැත්තන් හැර වෙනත් කිසිම තැනැත්තකු, ඇතුළුවීම හෝ එකී සීමාව ඇතුළත ප්‍රදේශයේ රැඳී සිටීම හෝ නොකළ යුතු ය.

6. ගුවන් හමුදාපතිවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධරයකු විසින් මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියේ වෙඩි තැබීම්වල නියැලී සිටින හෝ වෙඩි තැබීමේ අභ්‍යාසවලට සහභාගි වන තැනැත්තන්ට ආරක්ෂාව සැලසීම සඳහා අවශ්‍ය නියමයන් කරනු ලැබිය හැකි ය.

7. නීතියෙන් එසේ කිරීමට බලය පවරනු ලැබුවහොත් මිස, කිසිම තැනැත්තකු විසින් මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියේ එල්ල කරනු ලැබූ කිසිම අවියක් භාරා ගැනීම ඒවා සෙවීම හෝ ඒවාට අනවශ්‍යය ලෙස මැදිහත් වීම හෝ එබඳු කිසිම අවියක් ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියේ තිබී සොයා ගන්නා ලද කිසිම අවියක් තමා සන්තකයේ තබා ගැනීම හෝ කරනු නොලැබිය යුතු ය.

8. සැහැල්ලු අවි වෙඩි පිටි ඇතුළත් තිබී යම්කිසි අවියක් සොයා ගනු ලබන යම් තැනැත්තකු විසින් හැකිතාක් ඉක්මණින් එම සොයා ගැනීම පිළිබඳව චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයේ පීඨාධිපති වෙත හෝ එම අවිය සොයා ගනු ලැබූ වෙඩිපිටිය භාර නිලධාරියා වෙත හෝ වාර්තා කරනු ලැබිය යුතු ය.

9. මේ නියෝගවල විධිවිධාන හෝ ගුවන් හමුදාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් බලය පවරනු ලද නිලධරයකු විසින් නිකුත් කරන ලද යම් නියෝගයක් හෝ කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

10. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ගුවන් හමුදා නිලධරයකු විසින් හෝ බලයලත් හමුදාවල අධිකාරිලත් කවර හෝ නිලධරයකු විසින් මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටියෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

11. මෙහි 2 වන නියෝගය ප්‍රකාරව යම් තැනැත්තකු විසින් මීටර් 100 සැහැල්ලු අවි වෙඩි පිටිය ප්‍රයෝජනයට ගන්නා වූ යම් තැනැත්තකු විසින් දෙන ලද යම් බලයක් නැතහොත් අවසරයක් යටතේ සහ ඒ අනුව ක්‍රියාකරන යම් තැනැත්තකු විසින් සුළු අවි වෙඩි පිටිය ප්‍රයෝජනයට ගැනීමේ දී සද්භාවයෙන් කරන ලද කිසිවක් මේ නියෝග යටතේ වරදක් සංස්ථාපනය කරන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

12. මේ නියෝගවල -

''එල්ල කරන ලද අවි'' යන්නට, යම් පතරොමක් හෝ පතරොම් කොපුවක් හෝ ඒවායේ කොටසක් ඇතුළත් වේ.

13. 1983 ඔක්තෝබර් මස 28 දිනැති අංක 268/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1983 වෙඩි පිටි නියෝග යටතේ සිදු කරන ලද කිසිවකට අගති විරහිතව එම නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

12 - 197/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.